

SEDR
Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහයවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை
தீர்ப்பதற்கு ஆதரவளித்தல்

# යුක්තිමත් විකල්පයක් ශක්තිමත් කිරීම

ප්‍රතිපත්ති සංක්ෂිප්තය 2023

# මූලික සමීක්ෂණ සොයාගැනීම්

ප්‍රජා සමථ මණ්ඩලවලට ප්‍රවේශ වූවන්ගෙන් **89%**ක් ප්‍රකාශ කළේ තම ආරවුල් නිරාකරණය වූ ආකාරය පිළිබඳව සෑහීමකට පත්වන බවයි.

බොහෝ ප්‍රතිචාර දැක්වූවන් තහවුරු කළේ සාම්ප්‍රදායික විධිමත් යුක්තිය පසිඳලීමේ ක්‍රම භාවිතා කරනවාට වඩා, ඔවුන්ගේ ආරවුල් නිරාකරණය සඳහා ADR යාන්ත්‍රණ භාවිතා කිරීම **ලාභදායී** සහ **වේගවත්** බවයි.

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් **67%** ප්‍රකාශ කළේ ඕනෑම ADR සංසදයක පිරිමි සහ ගැහැණු සමාන නියෝජනයක් තිබිය යුතු බවයි.

ප්‍රජා සමථ මණ්ඩල භාවිතා කළ පුද්ගලයන්ගෙන් **80%**ක් අනාගතයේදී ඒවා නැවත භාවිත කිරීමේ සම්භාවිතාවක් ඇත.



# 1 හැඳින්වීම

ප්‍රජා පාදක විකල්ප ආරවුල් නිරාකරණ (ADR) යාන්ත්‍රණයන් ආරවුල් නිරාකරණයේදී සහ ප්‍රචණ්ඩත්වය දක්වා ගැටුම් වර්ධනය වීම වැලැක්වීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විවිධ පැතිකඩ ඔස්සේ සමාජ ආතතීන් පැතිර ගලා යන ශ්‍රී ලංකාවේ, ප්‍රජා පාදක ADR මුල පිරීම්[1] යුක්ති ප්‍රවේශයට එලදායී මාර්ග සපයයි. ශ්‍රී ලංකාවේ, එවැනි ප්‍රජා පාදක ADR යාන්ත්‍රණයන්, බහු-ආගමික කමිටු ලෙස මෙන්ම සිවිල් සමාජ සංවිධාන (CSO) විසින් ස්ථාපිත කරන ලද වෙනත් මුලපිරීම් කිහිපයකින්ද සමන්විත වේ. මීට අමතරව, ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සමථ මණ්ඩල (CMB) 300කට වැඩි ප්‍රමාණයක් හරහා ක්‍රියාත්මක වන හොඳින් ස්ථාපිත ජාතික සමථකරණ වැඩසටහනක් ඇති අතර එතුලින් මනාව පුහුණුව ලද ස්වේච්ඡා සමථකරුවන් 8,400ක් පමණ වසරකට ආරවුල් 250,000ක් පමණ නිරාකරණය උදෙසා කටයුතු කරති. මෙම සන්දර්භය තුළ, මෙවැනි ප්‍රතිපත්ති සංක්ෂිප්තයක් හරහා එවැනි මුලපිරීම් සඳහා ප්‍රවේශය ශක්තිමත් කිරීම සහ දැනුවත් කිරීම සඳහා පළමු පියවරක් ලෙස, ප්‍රජා පාදක ADR යාන්ත්‍රණයන් වෙත - විශේෂයෙන්ම ප්‍රජා සමථ මණ්ඩල - වෙත මිනිසුන්ගේ ප්‍රවේශය සහ දැනුවත්භාවය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් අවශ්‍ය වේ.

---

[1] මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තයේ අරමුණු සඳහා, ප්‍රජා පාදක ADR මුලපිරීම් යන්නෙන් හැඳින්වෙන්නේ ආගමික නායකයන්, රජයේ පරිපාලන නිලධාරීන් සහ ප්‍රජා සමථ මණ්ඩල වැනි ආරවුල් නිරාකරණයට සම්බන්ධ පුද්ගලයන් සහ යාන්ත්‍රණ ආදිය වේ.

යුරෝපා සංගමයේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන්, ආසියානු පදනම සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කෙරෙන වසර හතරක (2020 - 2024) ව්‍යාපෘතියක් වන ඵලදායීව ආරවුල් නිරාකරණයට සහයවීමේ (SEDR) ව්‍යාපෘතිය මෙහෙයවන බ්‍රිතාන්‍ය කවුන්සිලය මඟින්, **දැනුම, ආකල්ප සහ පරිචයන් (Knowledge, Attitudes and Practices - KAP)** පිළිබඳ සමීක්ෂණයක් දියත් කරනු ලැබීය. ආරවුල් නිරාකරණ යාන්ත්‍රණවල සඵලතාවය සහ ව්‍යාප්තිය වැඩි දියුණු කිරීමට සහ ශ්‍රී ලංකාව තුළ සමාජ සහජීවනය සහ වඩාත් ඇතුළත්කරණය වූ ප්‍රජා-රාජ්‍ය නියැලීම පෝෂණය කිරීමට, SEDR ව්‍යාපෘතිය කටයුතු කරයි. KAP සමීක්ෂණයේ අරමුණ වූයේ සමථ මණ්ඩල (ප්‍රජා සමථ මණ්ඩල සහ විශේෂ ඉඩම් සමථ මණ්ඩල යන දෙකම) ඇතුළුව විවිධ ප්‍රජා පාදක ADR මුලපිරීම් පිළිබඳව මහජනතාවගේ දැනුවත්බව පිළිබඳ මූලික තක්සේරුවක් සැපයීමයි.



මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තයෙන් KAP සමීක්ෂණයේදී ගවේෂණය කරන ලද ප්‍රධාන තේමා තුන වටා ලද සොයාගැනීම් ඉදිරිපත් කරයි:

## ADR ගැන මිනිසුන් **දන්නේ** මොනවාද?

## ADR ගැන මිනිසුන් **සිතන්නේ** කුමක්ද?

## ADR ගැන මිනිසුන්ගේ **අත්දැකීම්** මොනවාද?

සමීක්ෂණ දත්ත පිළිබඳ සම්පූර්ණ සහ සවිස්තරාත්මක විශ්ලේෂණය Knowledge, Attitudes and Practices Survey[2] අවසන් වාර්තාවේ දැකගත හැක.

[2] ජුනි 2022, www.sedrsrilanka.org/ තුලින් ලබාගත හැක.



# 2 KAP සමීක්ෂණය පිළිබඳව

2021/22 දී පවත්වන ලද KAP සමීක්ෂණය ගැන - ප්‍රජා සමථ මණ්ඩල පිළිබඳව අවසන් වරට සිදුකළ තක්සේරුවෙන් වසර 10 කට පසු - මෙම පර්යේෂණය ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් තුනම ආවරණය වන ලෙස කුටුම්බ 1,712 ඉලක්ක කර ගනිමින් දිවයිනේ දිස්ත්‍රික්ක හයක් ආවරණය කළේය. අම්පාර, ත්‍රිකුණාමලය, වවුනියාව, මන්නාරම, බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක හැරුණු විට, සංසන්දනාත්මක අංගයක් සැපයීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් (මහ නගර සභා බල ප්‍රදේශය තුළ) සීමිත නියැදියක් තෝරා ගන්නා ලදී. ප්‍රමාණාත්මක සමීක්ෂණය සඳහා, සමීක්ෂණය කරන ලද නිවාස අදාළ සමීක්ෂණ දිස්ත්‍රික්කවල ජනවාර්ගික ජනගහනය නියෝජනය කරන බව සහතික වන අයුරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ[3] සහ ග්‍රාම නිලධාරී වසම් තෝරාගනු ලැබුවේය.

මීට අමතරව, ප්‍රජා මැදිහත්වීම් සහ විකල්ප ආරවුල් නිරාකරණයට සම්බන්ධ නිලධාරීන් සමඟ මූලික පුද්ගල සම්මුඛ සාකච්ඡා (Key Informant Interviews - KII) විසිනවයක් (29) සහ CSO නියෝජිතයන්, ප්‍රජා සමථ මණ්ඩල සාමාජිකයින්, කාන්තාවන් සහ තරුණ තරුණියන් සමඟ නාභිගත කණ්ඩායම් සාකච්ඡා 25 ක් දිස්ත්‍රික්ක හය තුළ පවත්වන ලදී.


---

[3] ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක 25 කට බෙදා ඇත. සෑම දිස්ත්‍රික්කයක්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් යටතේ පාලනය වේ. දිස්ත්‍රික්ක තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 256 කට බෙදා ඇති අතර, ඒවා දළ වශයෙන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 14,008 කට බෙදා ඇත.

සමීක්ෂණය කරන ලද ස්ථාන හරහා සමස්ත ප්‍රතිඵල සලකා බැලීමේදී ප්‍රජා සමථ මණ්ඩලවල අනුගමනය කරන ක්‍රියාවලියට අදාළව පැහැදිලි දැනුම් පරතරයක් ඇත. මේ අනුව, සමීක්ෂණ ප්‍රතිඵල වලින් පෙනෙන්නට ඇත්තේ ප්‍රජා සමථ මණ්ඩලයන්හි ක්‍රියාවලිය පිළිබඳ ජාතික හා කලාපීය වශයෙන් අදාළ වන සහ ප්‍රයෝජනවත් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවර්ධනය කළයුතු බවයි.




රූපය 1: සමීක්ෂණයේ ඉලක්කගත දිස්ත්‍රික්ක






# 3 විකල්ප ආරවුල් නිරාකරණය පිළිබඳව මිනිසුන් දන්නේ මොනවාද?

සාමාන්‍යයෙන්, ප්‍රජා සමථ මණ්ඩල ඇතුළු ප්‍රජා පාදක ADR මුලපිරීම්වල නිරත වන්නේ කවුරුන්ද යන්න ජනතාව දන්නා නමුත් විශේෂ ඉඩම් සමථ මණ්ඩලය ගැන දන්නේ ඉතා අල්ප වශයෙනි. එසේම, ප්‍රජා සමථ මණ්ඩලයන් හි අරමුණ, එය ක්‍රියාත්මක වන ආකාරය, සමථකරණ සේවා වෙත ප්‍රවේශ වන්නේ කෙසේද සහ මණ්ඩලවල සංයුතිය පිළිබඳ ජනතාවගේ දැනුම සාපේක්ෂව අඩු වන අතර (විවිධ කොටස් අතර) එය වෙනස් වේ. ප්‍රජා සමථ මණ්ඩල උපයෝජනය දිරිමත් කිරීම සඳහා, මෙම දැනුම් පරතරය පියවා ගැනීමට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

**ගොඩක් අය කැමති නෑ තමන්ගෙ ප්‍රශ්න අනිත් අයට කියන්න. (මුස්ලිම් පල්ලියේ) භාරකාර මණ්ඩලය ආරවුල් නිරාකරණයට උපරිම උත්සාහයක් දරනවා. මුස්ලිම් පල්ලිය දුප්පත් මිනිසුන්ට බොහෝ සේවාවන් ඉටු කරනවා. පල්ලිය, අපිට එළිපිට කියන්න බැරි ප්‍රශ්න ගැන කතා කරනවා. ඔවුන් තමන් වෙත පැමිණෙන පුද්ගලයින්ගේ රහස්‍යභාවය ආරක්ෂා කරනවා.**

**(නාභිගත කණ්ඩායම් සාකච්ඡාව, කාන්තා සහ තරුණ, මොණරාගල)**

රූපය 2: ප්‍රතිචාරකයින් විසින් ප්‍රකාශිත ප්‍රධාන විකල්ප ආරවුල් නිරාකරණ යාන්ත්‍රණ





## 3.1 ADR හි නිරත වන්නේ කවුද?

බොහෝ ප්‍රතිචාරකයින් රාජ්‍ය නිලධාරීන් (පොලිසිය - 69% සහ ග්‍රාම නිලධාරී - 61%) ඔවුන්ගේ ප්‍රජාව තුළ ආරවුල් සම්බන්ධයෙන් කටයුතු කරන ක්‍රියාකාරීන් ලෙස හඳුනා ගනී. හතරෙන් පංගුවකට වඩා (27%) ප්‍රජා සමථ මණ්ඩල ADR ක්‍රියාකාරියකු ලෙස හඳුනා ගනී. ශ්‍රී ලංකා යෝනක ප්‍රජාව, අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම් හා සසඳන විට ආගමික නායකයින් ADR හි නියැලෙන්නන් ලෙස වඩාත් හොඳින් හඳුනති.


## 3.2 ප්‍රජා සමථ මණ්ඩල පිළිබඳ මූලික දැනුම්වත් බව ඉහළ මට්ටමක පැවතුනි

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 89%ක් ප්‍රජා සමථ මණ්ඩල ගැන අසා ඇත. නමුත්, කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිචාර දැක්වූවන් සහ සියලුම දිස්ත්‍රික්කවල තරුණයින්, පිළිවෙලින් අනෙකුත් දිස්ත්‍රික්ක සහ අනෙකුත් වයස් කාණ්ඩවලට සන්සන්දනය කිරීමේදී ප්‍රජා සමථ මණ්ඩල ගැන අසා තිබුණේ සාපේක්ෂව අඩු (පිළිවෙලින් 30% සහ 60%) මට්ටමකින් ය.

රූපය 3: මම ප්‍රජා සමථ මණ්ඩල ගැන අසා ඇත්තෙමි




රූපය 4: ප්‍රජා සමථ මණ්ඩල පිළිබඳ පහත සඳහන් නිශ්චිත විස්තර ගැන මම නොදනිමි




## 3.3 ප්‍රජා සමථ මණ්ඩල වල නිශ්චිත කාර්යයන් සහ ක්‍රියාවලිය පිළිබඳ දැනුම සාපේක්ෂව අඩුය

ප්‍රජා සමථ මණ්ඩල ගැන අසා තිබුණත්, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් ප්‍රජා සමථ මණ්ඩල පිළිබඳ විස්තර සහ ක්‍රියාවලි ගැන දැන සිටියේ නැත. ඒ අතරින් අවම දැනුම තිබුණේ සමථකරණ සහතිකය නිකුත් කිරීම, ආරවුලක් නිරාකරණය සඳහා දවසක් තුල වෙන් කරන ලද කාලය සහ ප්‍රජා සමථ මණ්ඩලයන්හි ඉදිරිපත් කර සාකච්ඡා කරන ලද තොරතුරු අධිකරණයේදී භාවිතා කළ හැකිද යන කරුණු පිළිබඳව ය.

## 3.4 විශේෂ සමථ මණ්ඩල (SMB)[4] පිළිබඳ දැනුම්වත්බව ඉතා අඩු මට්ටම් වල පැවතිණි.

ඉඩම් පිළිබඳව වැනි ක්‍රියාකාරී විශේෂ සමථ මණ්ඩල ඇති දිස්ත්‍රික්කවල පවා ඒවායේ පැවැත්ම, ක්‍රියාකාරකම් සහ අනුගමනය කරන ක්‍රියාවලිය පිළිබඳව ප්‍රතිචාරකයින්ට ඇති අවබෝධය ඉතා අල්ප බව ගුණාත්මක අධ්‍යයනයෙන් හෙළි වේ. දිස්ත්‍රික්කය තුළ විශේෂ ඉඩම් සමථ මණ්ඩල තිබියදී පවා, ඉඩම් ආරවුල් තවමත් ප්‍රජා සමථ මණ්ඩල වලට වාර්තා වන බව ප්‍රතිචාරකයින්ගේ අදහස විය. ප්‍රජා සමථ මණ්ඩල මෙන් නොව, විශේෂ සමථ මණ්ඩල සාපේක්ෂව අලුත් වන අතර ප්‍රජාවන් සමඟ දුරස්ථභාවයක් ඇති කරමින් දිස්ත්‍රික් මට්ටමින් පිහිටා ඇත. මෙම දුරස්ථභාවය විශේෂ සමථ මණ්ඩල පිළිබඳ දැනුවත්භාවය මද කමට හේතුව විය හැකිය.

## 3.5 සමාජ ආතතීන් ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය වීම වැලැක්වීම සඳහා ADR සහ ප්‍රජා සමථ මණ්ඩල වැදගත් යාන්ත්‍රණ ලෙස සැලකේ

ප්‍රජා මට්ටමින් ගත් කළ, වාර්ගික වශයෙන් මිශ්‍ර ජනගහනයක් නිරීක්ෂණය වූ බොහෝ අධ්‍යයන ස්ථානවල, කණ්ඩායම් අතර ආරවුල් වාර්ගික හෝ වාර්ගික රේඛා ඔස්සේ ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය වීමේ ප්‍රවණතාවය - සහ එවැනි ආතතීන් වර්ගවාදී කෝලාහල ලෙසට විකාශනය වීමේ සම්භාවිතාව - ගුණාත්මක සාකච්ඡා අතරතුර ඉස්මතු විය. එවැනි අවස්ථාවන්හිදී, විවිධ මතභේදකාරී කණ්ඩායම් අතර ඇති සැකයන් ආමන්ත්‍රණය කිරීම සහ විශ්වාසය දිනා ගැනීම ඉතා වැදගත් බව දක්නට ලැබෙන අතර ADR යාන්ත්‍රණයන් මෙම කාර්යභාරය ඉටු කරනු ඇතැයි විශ්වාස කෙරේ.

**(සමාජ) ක්‍රමයේ හිඩැස් ආමන්ත්‍රණය කරන අතරතුරම වෙනසක් ඇති කිරීමට සහ ADR ශක්තිමත් කිරීමට පැහැදිලි අවශ්‍යතාවයක් සහ අවස්ථාවක් තිබේ:** ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 73ක් - ඔවුනතරින් බහුතරයක් ලෙස යෞවනයින් - පවසන්නේ, ඔවුන් ප්‍රජා සමථ මණ්ඩල ක්‍රියාවලිය ගැන වැඩි විස්තර දැනගැනීමට කැමති බවයි. ප්‍රජා සමථ මණ්ඩල සමාජ සහජීවනය පවත්වා ගැනීමට උපකාරී වන බව සලකන අතර, කුලය, මුදල් සහ සමාජ තරාතිරම මත වෙනස් කොට සැලකීම පිළිබඳ දිගුකාලීනව පැවත එන මතයන්, ප්‍රජා සමථ මණ්ඩලවල කාර්යක්ෂමතාව අඩු කළ හැකි හේතු ලෙස දක්වා ඇත.

[4] 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත. වගන්ති 2, 3 සහ 8 යටතේ නියමය.



# 4 ADR ගැන මිනිසුන් සිතන්නේ කුමක්ද?

## 4.1 ADR කොතරම් ඵලදායීද?


ADR යාන්ත්‍රණය කෙතරම් ඵලදායීද යන්න සම්බන්ධයෙන් ක්‍රියාකරු-විශේෂිත හේතු දක්වා ඇත. ගැටලුව සමඟ ධනාත්මකව කටයුතු කිරීම සහ නිසි ලෙස/සාධාරණ ලෙස ආරවුල් නිරාකරණය සහ ආරවුල නිරාකරණය කළහැකි බව විශ්වාස කිරීම, යනාදිය ප්‍රජා සමථ මණ්ඩල සම්බන්ධයෙන් පැවසෙන අතර, එය උනන්දුව මත පදනම් වූ මැදිහත්වීමේ ප්‍රවේශයන් අගය කිරීමක් පිළිබිඹු කරයි. අනෙක් අතට රජයේ නිලධාරීන් ඔවුන්ගේ ප්‍රජාවන් පිළිබඳ ඉහළ මට්ටමේ දැනුමක් ඇති අය ලෙස ගැනෙන අතර, ආගමික නායකයින් ආරවුල් නිරාකරණය සම්බන්ධයෙන් අපක්ෂපාතී/සාධාරණ ප්‍රතිචාරයක් දක්වන බව දක්නට ලැබේ.

## 4.2 ADR හි විවිධ ක්‍රියාකාරීන් ආරවුල් හොඳින් කළමනාකරණය කරන්නේ ඇයි?

නිශ්චිත ප්‍රජා-පාදක ADR යාන්ත්‍රණ ඵලදායී යැයි මිනිසුන් සිතන්නේ මන්දැයි විමසූ විට, ඔවුන් විවිධ සහ ක්‍රියාකරු-විශේෂිත හේතු සපයා ඇත.


**ප්‍රජා සමථ මණ්ඩල:** ප්‍රජා සමථ මණ්ඩල ගත් කළ, ආරවුල් සම්බන්ධයෙන් ධනාත්මකව කටයුතු කිරීම, ගැටලුව නිසියාකාරව/සාධාරණව නිරාකරණය සහ ආරවුල නිරාකරණය කළහැකි බවට විශ්වාස කිරීම යන හේතු ඇතුළත් වේ.

රූපය 5: CMB ආරවුල හොඳින් කළමනාකරණය කරන්නේ ඇයි?





**රජයේ නිලධාරීන් (ප්‍රධාන වශයෙන් ග්‍රාම නිලධාරීන්) සහ ආගමික නායකයන්:** රජයේ නිලධාරීන් සහ ආගමික නායකයන් මිනිසුන්ගේ ගෞරවයට පාත්‍ර වී ඇති බැවින් ආරවුල් හොඳින් නිරාකරණය කරන බව (ප්‍රතිචාරකයින්) දකිති.


රූපය 6: රජයේ නිලධාරීන් ආරවුල හොඳින් කළමනාකරණය කරන්නේ ඇයි?




රූපය 7: ආගමික නායකයින් ආරවුල හොඳින් කළමනාකරණය කරන්නේ ඇයි?



රූපය 8ඃ පොලිසිය ආරවුල හොඳින් හසුරුවන්නේ ඇයි?





**පොලිසිය:** පැමිණිලි ක්‍රියාවලියකදී සාමාන්‍යයෙන් පළමු හෝ දෙවන සම්බන්ධතා ස්ථානය ලෙස ආරවුල් නිරාකරණයේ දී පොලිසිය ප්‍රධාන භූමිකාවක් රඟ දක්වයි. එබැවින්, ඔවුන් සතු අධිකාරිය සහ බලය මෙන්ම ඔවුන් සතු ප්‍රවේශයේ පහසුව සහ ප්‍රතිචාර දැක්වීමේ වේලාවන් නිසා මිනිසුන් තවමත් ආරවුල් නිරාකරණය සඳහා පොලිසිය භාවිතා කිරීමට කැමති වුවද, දුරස්ථභාවය සහ භාෂා සම්බන්ධ බාධක, මිනිසුන් පොලිසිය වෙත යෑමේ පෙළඹවීම අඩු කරන්නේය.

## 4.3 ප්‍රජා සමථ මණ්ඩල සහ ආගමික නායකයින් වෙත යෑම අඩු වියදම් සහ කාලය ඉතිරි කරන පියවරකි

ප්‍රජා හෝ පුද්ගලික ආරවුල් නිරාකරණය සඳහා ආගමික නායකයින් සහ ප්‍රජා සමථ මණ්ඩල වෙත ළඟා වීම ලාභදායී සහ වේගවත් වේ. ආරවුල නිරාකරණය සඳහා අධිකරණය සහ පොලිසිය වෙත යාමෙන් වැඩි මුදලක් වැය කිරීමට ඉඩ ඇති බව පිළිවෙලින් 64% ක් සහ 40%ක් ප්‍රතිචාරකයින් පැවසූහ.

රූපය 9ඃ පුද්ගලික හෝ ප්‍රජා ආරවුල් නිරාකරණයට යන මුදල හා කාලය පිළිබඳ හැඟීම




## 4.4 ADR හි කොටසක් විය යුත්තේ සහ ඒවායේ මූලසුන දැරිය යුත්තේ කවුද?

ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 67% ප්‍රකාශ කළේ ඕනෑම ADR සංසදයක පිරිමි සහ ගැහැණු සමාන නියෝජනයක් තිබිය යුතු බවයි. ADR සංසදයකට වඩාත් ඔබින මූලසුනදාරියකු සම්බන්ධයෙන් ගත් කල, බොහෝ පිරිමි ප්‍රතිචාර දැක්වූවන් පිරිමි මූලසුනකට කැමැත්තක් දැක්වූ අතර කාන්තා ප්‍රතිචාර දැක්වූවන් විසින්ද කාන්තා මූලසුනකට වඩා පිරිමි මූලසුනකට මනාප ලබා දෙන ලදී. මෙය ශ්‍රී ලංකාවේ ප්‍රජා සමථකරණයේ කාන්තාවන්ගේ භූමිකාව පිළිබඳ පසුගිය අධ්‍යයනයන්හි සොයාගැනීම් සනාථ කරයි. එමඟින් 'සමථකරුවකු ලෙස වයස්ගත පිරිමියෙක්'[5] සඳහා මනාපයක් හඳුනාගෙන ඇත.

කෙසේ වෙතත් අතීත අධ්‍යයනයන් ද, කාන්තාවන් විසින් ගෙනෙන, විශේෂයෙන් පවුල් ආරවුල් වැනි සංවේදී කරුණු සාකච්ඡා කිරීමේදී  කාන්තා සමථකාරවරියකු සඳහා මනාපයක් පෙන්නුම් කරයි[6].

## 4.5 ADR සංසදවල ස්ත්‍රී-පුරුෂ සමාජ භාවයේ නියෝජනය

රූපය 10: ප්‍රතිචාරකයින්ට අනුව ADR සංසදය සඳහා වඩාත් සුදුසු ස්ත්‍රී පුරුෂ සංයුතිය





---

[5] Community Mediated Justice in Post-War Sri Lanka (2016), de Silva, Jayasundere, and Rahman.
[6] Community Mediation (2028), Munas et al.

**ADR හි පවතින ශක්තීන් තවත් ගොඩ නැගීම සහ හඳුනාගත් හිඩැස් ආමන්ත්‍රණය කිරීම සඳහා ඇති අවස්ථා:** නිශ්චිත ADR යාන්ත්‍රණයන් යම් යම් ආරවුල් නිරාකරණය කිරීම සඳහා ඵලදායී ලෙස සැලකේ. එනිසා, ඒවා විසඳන ආරවුල් වර්ග අනුව ADR යාන්ත්‍රණ දෙස සමීපව බැලීම, ඒවායේ සඵලතාවය අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් ADR යාන්ත්‍රණ සමථයකට පැමිණීමේදී පිරිවැය සහ කාලය ඵලදායීව වැයකරන බව සැලකේ. කෙසේ වෙතත්, බල රහිත, දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් විසින් ගෙන එන නීත්‍යානුකූල දුක්ගැනවිලි සාකච්ඡා කිරීම හෝ සමථකරණය සම්බන්ධයෙන් - එයිනුත්, විශේෂයෙන්ම දිළිඳු ජනතාවට විධිමත් අධිකරණ ක්‍රියාවලීන් වෙත ප්‍රවේශ වීමට ඇති අයිතිය සම්බන්ධයෙන් ඉස්මතු කර ඇති කරුණු කාරණා සම්බන්ධයෙන් - සුවිශේෂ අවධානය යොමු කළ යුතුය.

රූපය 11: ප්‍රතිචාරකයින්ට අනුව ADR සංසදය සඳහා වඩාත් සුදුසු මුලසුන



# 5 මිනිසුන්ගේ ADR අත්දැකීම අපට පෙන්වන්නේ කුමක්ද?




## ප්‍රජා සමථ මණ්ඩල වෙත යොමු වූ අය ඔවුන්ගේ ආරවුල නිරාකරණය පිළිබඳව ඉතා සෑහීමකට පත්වේ

ප්‍රජා සමථ මණ්ඩලවලට ප්‍රවේශ වූවන්ගෙන් සියයට 89 ක් ප්‍රකාශ කළේ ආරවුල නිරාකරණය කරගත් ආකාරය පිළිබඳව සෑහීමකට පත්වන බවයි. ප්‍රජා සමථ මණ්ඩල වලට යොමුවූ අය නැවතත් සමථ මණ්ඩල වෙතට යන ඉඩකඩ ඉහළයි. දැනුම්වත්භාවය ඇති කිරීමට සහ එමගින් ප්‍රජා සමථ මණ්ඩල වෙත ප්‍රවේශ වීමට ජනතාව දිරිමත් කිරීමට ඇති වැඩි හැකියාව මෙය අවධාරනය කරයි.

## 5.1 ආරවුල් නිරාකරණ ක්‍රියාවලිය පිළිබඳ තෘප්ති මට්ටම


රූපය 12: ආරවුල නිරාකරණය ගැන සෑහීමකට පත්වූ පාර්ශවයන්





## 5.2 ප්‍රජා සමථ මණ්ඩලවලට යොමුවූ අය නැවතත් ඒවා වෙත ප්‍රවේශ වන ඉඩකඩ ඉහළයි.

ප්‍රජා සමථ මණ්ඩලවලට යොමුවූ අයගෙන් 80% ක් ප්‍රකාශ කර ඇත්තේ තමන් නැවත ප්‍රජා සමථ මණ්ඩල වෙත ප්‍රවේශ වීමට ඉඩ ඇති බවයි, නමුත් ප්‍රජා සමථ මණ්ඩල භාවිතා නොකළ අය අනාගතයේදී ප්‍රජා සමථ මණ්ඩල භාවිතා කිරීමට අඩු ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. ප්‍රජා සමථ මණ්ඩල භාවිතා කිරීමට අතිශයින්ම ඉඩ ඇති බව අඟවන අය, පහසු ප්‍රවේශය, පිරිවැය අඩු හෝ පිරිවැයක් නොමැති වීම, කෙටි ක්‍රියාවලිය, ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසය සහ විසඳුම් ඵලදායී වීම, ඔවුන්ගේ මනාපයට හේතු ලෙස දක්වා ඇත.

රූපය 13: CMB නැවත භාවිතා කිරීමේ සම්භාවිතාව - කලින් CMB වෙත යොමුවූ ප්‍රතිචාරකයින්




**ප්‍රජා සමථ මණ්ඩල වෙත ප්‍රවේශ වූ අය වෙත ප්‍රජා සමථ මණ්ඩල පිළිබඳව ඇති ඉහළ තෘප්තියෙන් උපරිම ප්‍රයෝජනය ලබාගත යුතුය:** ප්‍රජා සමථ මණ්ඩල වෙත ප්‍රවේශ වූ අය අතර තෘප්තිය ඉහළ මට්ටමක පැවතීම ධනාත්මක වන අතර එය අනාගත දැනුම්වත් කිරීමේ ව්‍යාපාරවල කේන්ද්‍රීය කරුණක් කරගත යුතුය. විශේෂයෙන්ම ප්‍රජා සමථ මණ්ඩල වෙත ළඟා වන නව පරිශීලකයින් සඳහා කටවහරින් වන නිර්දේශ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන නිසාම, අපේක්ෂිත විසඳුමක් නොලැබෙන අවස්ථාවන්හි වාද කරුවන්ගේ අතෘප්තියට තුඩු දෙන සාධක ද එවැනි ප්‍රචාරණ ව්‍යාපාර මගින් තක්සේරු කර ආමන්ත්‍රණය කළ යුතුමය.



# 6 කුසලතා සහ නිපුණතා

## 6.1 සමථකාරවරුන් පත් කිරීම

පෙර අධ්‍යයනයන් මගින් වැඩි වැඩියෙන් කාන්තාවන් සමථකාරවරියන් වීමට දිරිගැන්වීමේ වැදගත්කම ඉස්මතු කර පෙන්වන අතරම, ඔවුන්ට නිවසේදී ඉසිලීමට සිදුවන අමතර කාර්යභාරයන් නිසා සමථකරණය වැනි ස්වේච්ඡා වැඩ සඳහා ඔවුන්ගේ සහභාගීත්වය සීමා කෙරෙන බවද ගෙනහැර දක්වයි[7]. තවද, බොහෝ ප්‍රජා සමථ මණ්ඩලවල සාමාන්‍ය වයස් සංයුතිය අවුරුදු 50 ට වැඩි වේ.

ප්‍රජා සමථ මණ්ඩලයන්හි සමථකරුවන් සහ සභාපතිවරුන් සමඟ කළ සාකච්ඡාවලදී පුද්ගලික සහ වෘත්තීය කැපවීම් (උදාහරණයක් ලෙස වැඩිදුර අධ්‍යාපනය සඳහා අවශ්‍ය කාලය) වැනි කරුණු හේතුවෙන් තරුණයින් සමථකරණයට සහභාගී වීම සීමා කරන බව අවධාරණය කෙරිණි. කෙසේ වෙතත්, විශේෂයෙන්ම ඩිජිටල් තාක්ෂණය හරහා වඩා හොඳ තොරතුරු කළමනාකරණයක් සඳහා අවශ්‍යතාවක් ඇති පසුබිමක, ප්‍රජා සමථ මණ්ඩලවල ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා තරුණ හා වැඩිහිටි වයස් කාණ්ඩ අතර වඩා හොඳ සමතුලිතතාවයක් අවශ්‍ය බවට පොදු එකඟතාවයක් තිබුණි.

[7] (Jayasundere and Rahman, 2016; Jayasundere and Valters, 2014)

## 6.2 සමථකාරවරුන් සඳහා පුහුණුව

බොහෝ සමථකාරවරුන්ගේ අදහස වූයේ පත්වීම් අදියරේදී ලබා දුන් දින පහක පුහුණුවට සමථකරණය පිළිබඳ බහුවිධ අංශ ඇතුළත් වූ බැවින් එය ඉතා ප්‍රයෝජනවත් වූ බවයි. තවද, සමථකාරවරුන්ගේ සහ සමථකරණ පුහුණුවීම් නිලධාරීන්ගේ (MTO) මතය වූයේ ප්‍රජාවට වඩා හොඳ සේවාවක් සහතික කිරීම සඳහා, උනන්දුව මත පදනම් වූ සමථකරණය සහ සමථකරණ ක්‍රියාවලියේ මූලධර්ම පිළිබඳ 'නැවුම්කරණ පාඨමාලා' නියමිත කාල පරාසයන්හිදී පිරිනැමීම අවශ්‍ය බවයි.

## 6.3 සම්පත් සහ යටිතල පහසුකම්

සම්පත් සම්බන්ධයෙන් ගත් කල, තොරතුරු තාක්ෂණ (IT) උපකරණ මඳකම සහ වඩා හොඳ තොරතුරු කළමනාකරණය, දත්ත රැස් කිරීම, එලදායී පසු විපරම් සහ අධීක්ෂණය සඳහා පුහුණුවේ අවශ්‍යතාවය සමථකාරවරුන්, ප්‍රජා සමථ මණ්ඩලයන්හි සභාපතිවරුන් සහ MTO වරුන් විසින් ඉස්මතු කරන ලදී. තවද, අධ්‍යයනය කරන ලද ඇතැම් ස්ථානවල සුදුසු ඉඩක් නොමැතිකම පිළිබඳව ද සාකච්ඡා කෙරිණි. මෙය කලින් සාකච්ඡා කළ පෞද්ගලිකත්වය නොමැතිකම පිළිබඳ ගැටළුව සනාථ කරයි.

**'සමථ මණ්ඩලය සඳහා ස්ථිර ස්ථානයක් නැහැ. වියදම අඩු කර ගන්න රජය මෙම සමථ මණ්ඩලය රජයේ පොදු ගොඩනැගිලි තුළ ක්‍රියාත්මක කරනවා. පුද්ගලයන් කණ්ඩායම් 5ක් පමණ සිටිනවා (එක් පොදු ශාලාවක ආරවුල් 5ක් නිරාකරණය කරනවා). ඒ නිසා, (එහෙම අවස්ථාවන්වල) සමථකරණයේ රහස්‍යභාවය සහතික කිරීමේ මූලික සංකල්පය අනුගමනය කෙරෙන්නේ නෑ.'**

**(KII, ත්‍රිකුණාමලය)**



# 7 නිගමනයන්

## දැනුම

ප්‍රජා මට්ටමින් ADR යාන්ත්‍රණ පැවතීම සමාජ ආතතීන් විශාල ගැටුම් හෝ ප්‍රචණ්ඩත්වය දක්වා වර්ධනය වීම වැළැක්වීමට උපකාරී වේ. මෙම උත්සාහයන් ප්‍රජාවන් අතර සමගිය සහ සමස්ත වශයෙන් සාමය සඳහා දායක වේ.

සාමාන්‍යයෙන් ප්‍රවේශය සහ සමීපත්වය ADR පිළිබඳ දැනුම/දැනුම්වත්කම මත බලපෑමක් දක්වයි.

පොදුවේ ගත්කල, ප්‍රජා සමථ මණ්ඩලයන්හි පැවැත්ම ගැන මිනිසුන් දන්නා නමුත් එහි අරමුණ, එය ක්‍රියාත්මක වන ආකාරය, ප්‍රජා සමථ මණ්ඩල වෙත ප්‍රවේශ වන්නේ කෙසේද සහ ප්‍රජා සමථ මණ්ඩලයන්හි සංයුතිය පිළිබඳ දැනුම වෙනස් වේ. තරුණ වයස් කණ්ඩායම්, කාන්තාවන් සහ ශ්‍රී ලාංකික දෙමළ සහ යෝනකවරුන් අතර ප්‍රජා සමථ මණ්ඩල පිළිබඳ දැනුම දුර්වල විය.

විශේෂයෙන්ම, තම ආරවුල් නිරාකරණයට ප්‍රජා සමථ මණ්ඩල වෙත ප්‍රවේශ වූ හෝ එම ක්‍රියාවලියේදී තම සගයින්ට උපකාර කළ අය අතර දැනුම්වත්භාවය ඉහළ මට්ටමක පවතී.

ප්‍රතිචාරකයින්ට අනුව ADR සංසදයක මනා සංයුතියක ග්‍රාම නිලධාරී වැනි රජයේ නිලධාරීන්, ගමේ වැඩිහිටියන් සහ ආගමික නායකයින් ඇතුළත් වේ.

ප්‍රජා සමථ මණ්ඩලවල මෙහෙයුම් සම්බන්ධයෙන් බලන විට, පවුල් ආරවුල් වැනි සංවේදී ගැටළු ADR යාන්ත්‍රණ වෙත ගෙන යන බැවින්, ADR සහ ප්‍රජා සමථ මණ්ඩල සඳහා පෞද්ගලිකත්වය සහතික කිරීම ඉතා වැදගත් වේ.

## ආකල්ප

ප්‍රජා සමථ මණ්ඩල සහ ආගමික නායකයින් ආරවුල් නිරාකරණය සඳහා පිරිවැය සහ කාලය ඵලදායීව වැයවන විකල්ප ලෙස මිනිසුන් දකී. එනමුත්, කුලය, මුදල් සහ සමාජ තරාතිරම මත වෙනස් කොට සැලකීම සම්බන්ධයෙන් දරන දීර්ඝ කාලීන මතභේදයන් ප්‍රජා සමථ මණ්ඩලවල සඵලතාවය අඩු කළ හැකි හේතු ලෙස දක්වා ඇත.

මිනිසුන් පොලිසිය වෙත යොමුවන්නේ ඉහළ ප්‍රවේශයක් සහ ආරවුල් නිරාකරණය සඳහා එයට හිමි අධිකාරී බලය පිළිබඳ විශ්වාසය මත ය. කෙසේ වෙතත්, නිදසුනක් වශයෙන් පොලිසියේදී මුහුණ දෙන භාෂාමය බාධක, නිරාකරණය කිරීමේ ක්‍රියාවලීන් සීමා කරන බව පෙනේ.

ADR යාන්ත්‍රණවල සංයුතිය පිළිබඳ මතයන් සලකන විට, ADR සාමාජිකයින් ලෙස පිරිමින් සහ කාන්තාවන්ගේ සමාන නියෝජනය වැදගත් ලෙස සලකන අතර, දිගුකාලීනව දැරූ ස්ත්‍රී-පුරුෂ සමාජභාවමය සංකල්ප හේතුවෙන් සමථකාරවරියන් ඇතුළුව ADR ක්‍රියාකාරීන් ලෙස කාන්තාවන්ගේ ශක්‍යතාවය පිළිබඳ ප්‍රශ්න පැන නගී.

ADR සංසදවල මූලාසනය සම්බන්ධයෙන් ගත් කල, සංසදයේ පිරිමි මූලාසනදාරියකු පත්කිරීමට පිරිමි සහ ගැහැණු බහුතරයක් කැමැත්තක් දැක්වූයේ, පිළිගත් සමථකරු හෝ සභාපතිවරයා ලෙස 'මැදි වයසේ පුරුෂයා' දැකීමේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවමය සම්මතයන් ඉස්මතු කරමින්ය.

## පරිචයන්

වැඩි සහභාගීත්වය, ක්‍රමයේ නම්‍යශීලී බව සහ ADR පද්ධති විසින් පිරිනමනු ලබන තේරීම් පරාසය - විශේෂයෙන් ප්‍රජා සමථ මණ්ඩල - මෙම ක්‍රමය සඳහා මිනිසුන් දක්වන මනාපයට හේතු කිහිපයක් වේ.


ADR යාන්ත්‍රණ වෙත ප්‍රවේශ වීමේ පුද්ගල පරිචයන් මතුවන්නේ එවැනි ක්‍රම සමඟ බැඳුනු ඔවුන්ගේ හෝ ඔවුන්ගේ සගයන්ගේ අත්දැකීමෙනි.

ADR 'අඩු වියදම්' විකල්පය ලෙස සැලකීම නිසා, වඩාත් බැරෑරුම් අවස්ථාවන්හිදී විධිමත් අධිකරණ ක්‍රියාවලීන් වෙත ප්‍රවේශ වීම දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට නොදැනුවත්වම අහිමි වීමේ අවදානමක් ඇත. එබැවින්, රෙගුලාසිවලට අනුකූලව, එවැනි තත්ත්වයන් වැළැක්වීමට සහ විධිමත් නිරාකරණ යාන්ත්‍රණයන් තෝරා ගැනීමේ අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමට පියවර ගත යුතුය.

ප්‍රජා සමථ මණ්ඩලයන්හි කාර්යභාරය, ක්‍රියාකාරීත්වය, හා සංයුතිය පිළිබඳව - විශේෂයෙන් මුදල් හා කාලය ඉතිරි කර ගැනීමට හැකි මහජනතාවට පිරිනමන සේවාවක් ලෙස එම යාන්ත්‍රණය කෙරෙහි අවධානය යොමු කරමින් - දැනුම්වත්භාවය වැඩි කිරීම අවශ්‍ය වේ.

සම්පත් සම්බන්ධයෙන් ගත් කල, තොරතුරු තාක්ෂණ උපකරණ නොමැතිකම සහ වඩා හොඳ තොරතුරු කළමනාකරණය, දත්ත රැස් කිරීම, ඵලදායී පසු විපරම් සහ අධීක්ෂණය සඳහා පුහුණුවේ අවශ්‍යතාවය සමථකාරවරුන්, සභාපතිවරුන් සහ MTO වරුන් විසින් ඉස්මතු කරන ලදී.







# 8 නිර්දේශ

ප්‍රජා පාදක ADR, සහ විශේෂයෙන්ම ප්‍රජා සමථ මණ්ඩල, සමාජ ආතතීන් උත්සන්න වීම වැළැක්වීම මගින් සමාජ සහජීවනයට මග පෑදීමෙන් සිදුකරන වැදගත් කාර්යභාරය සැලකිල්ලට ගෙන, ප්‍රජා මට්ටමේ ADR පිළිබඳ දැනුම්වත්භාවය වැඩි කිරීමට සහ ඒවායේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට පහත පියවර නිර්දේශ කරනු ලැබේ.

- පොදුවේ ADR ක්‍රියාවලිය සහ විශේෂයෙන්ම ප්‍රජා සමථ මණ්ඩල පිළිබඳව සහ එවෙත ප්‍රවේශ වීම පිළිබඳව ඉලක්කගත දැනුවත් කිරීම් ක්‍රියාවලියක් සැලසුම් කිරීම සහ දියත් කිරීම.

- ආගමික නායකයින් ඇතුළු ADR ක්‍රියාකාරීන් සඳහා කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීමේ සැසි පැවැත්වීම.

- ශ්‍රී ලංකා පොලිසියේ අදාළ බලධාරීන් සමඟ පර්යේෂණ සාක්ෂි බෙදා ගැනීම. විශ්වාසය, විශ්වාසය ගොඩනැගීම, පක්ෂග්‍රාහීකම් තුරන් කිරීම සහ දූෂණ චෝදනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

- අදාළ MTO වරුන්, ප්‍රජා සමථ මණ්ඩල සභාපතිවරුන් සහ ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් වැනි අදාළ රාජ්‍ය නිලධාරීන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම ආදිය සමථකරණය භාර සංවර්ධන නිලධාරීන්ගේ සේවාවන්වලට ඇතුළත් කිරීම.

- MTO වරුන් සහ සමථකාරවරුන්ගේ පුහුණු අවශ්‍යතා අඛණ්ඩ තක්සේරුවට ලක්කිරීම සහ යාවත්කාලීන කිරීම.

- ජාතික සමථකරණ වැඩසටහන සඳහා විස්තීර්ණ, මධ්‍යගත, සම්බන්ධිත තොරතුරු කළමනාකරණ පද්ධතියක් (Management Information System) සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ප්‍රජා සමථ මණ්ඩලපවත්වනු ලබන අවකාශය තුළ පෞද්ගලිකත්වය සහතික කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

- මූල්‍ය ආරවුල් සහ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශේෂ සමථ මණ්ඩල මේ වනවිට ක්‍රියාත්මක නොවන දිස්ත්‍රික්කවලට හඳුන්වාදීම.



# සටහන්

# සටහන්

# යුක්තිමත් විකල්පයක් ශක්තිමත් කිරීම

ප්‍රතිපත්ති සංක්ෂිප්තය

මාර්තු 2023

© Copyright

SEDR

Supporting Effective Dispute Resolution
ඵලදායීව ආරවුල් නිරාකරණයට සහයවීම
பயனுறுதிமிக்கவகையில் பிணக்கை
தீர்ப்பதற்கு ஆதரவளித்தல்


Part of the programme

STRIDE
STRENGTHENING TRANSFORMATION, RECONCILIATION AND INCLUSIVE DEMOCRATIC ENGAGEMENT

Funded by the European Union

Implemented by

BRITISH COUNCIL

The Asia Foundation

Supported by: Centre for Poverty Analysis (CEPA)



මෙම ප්‍රකාශනය යුරෝපා සංගමයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව නිෂ්පාදනය කරන ලද්දකි. එනමුත් එහි අන්තර්ගතය
SEDR හි වගකීමක් වන අතර, එය යුරෝපා සංගමයේ අදහස් අවශ්‍යයෙන්ම පිළිබිඹු නොකරයි.



19, 1/1, De Fonseka Place, Colombo 04.

www.SEDRSriLanka.org

sedr@britishcouncil.org

@SEDRSriLanka


#SEDRtogether
#MakeGreatSTRIDES